**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2019**
**-------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**--------------------------------**

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ දහම් පාසල් දිනය නිමිති කරගෙන අලෙවි කිරීම සඳහා රු.10,670,500 ක් වටිනාකම වූ කොඩි 1,067,050 ක් හා රු.2,490,250 ක් වූ ස්ටිකර් 99,610 ක් ශාසනාරක්ෂක බල මණ්ඩල 314 ක් සඳහා බෙදා හැර තිබුණි. කොඩි අලෙවි ආදායම ගිණුම්ගත කිරීමේදී මාසික බැංකු ප්‍රකාශනයේ ලැබීම්වල එකතුව ආදායම ලෙස ගිණුම්ගත කරනු ලබන අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී කොඩි අලෙවි ආදායම ලෙස රු.4,145,363 ක් ගිණුම්ගත කර තිබුණද, එයින් රු.1,060,580 ක් තහවුරු කර ගැනීම සඳහා කොඩි අලෙවි වාර්තා ඉදිරිපත් නොවුණි. තවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොවිකිණී ඉතිරිවූ කොඩි ප්‍රමාණය පිළිබඳ වාර්තා අරමුදල සතු නොවීම හේතුවෙන් ගිණුම්ගත කරන ලද ආදායමෙහි නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය තහවුරු කරගත නොහැකි විය. | ඉදිරියේදී විධිමත් වැඩපිළිවෙලක් යටතේ කොඩි අලෙවිය, ආදායම එකතු කිරීම් හා ඉතිරි කොඩි ලබා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගනිමි. | අලෙවි වාර්තා ගෙන්වා ගැනීමේ කටයුතු විධිමත් කිරීම, අධීක්ෂණ නිලධාරියෙකු පත්කර ගැනීම හා දෙසැම්බර් 31 දිනට ඉතිරි කොඩි ගණනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

## 1.6 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 6 ඡේදයේ අරමුදලේ සාමාන්‍ය බලතල යටතේ දක්වා ඇති (අ) හා (ඊ) උප ඡේද පරිදි අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් නිළධාරීන් සහ සේවකයන් පත්කිරීම හා සේවයේ යෙදවීම සඳහා කටයුතුකර නොතිබුණි. | දැනට නිලධාරිනියන් දෙදෙනෙක් සේවයේ යොදවා ඇත. | ස්ථිර සේවක සංඛ්‍යාවක් අනුමතකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,491,355 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,514,220 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,977,135 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ගොඩනැඟිලි ආධාර වශයෙන් රු.2,300,000 ක් ගෙවීම් කරනු ලැබුවද, පරිත්‍යාග වශයෙන් රු.10,000,000 ක් අරමුදලට ලැබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වාමීන් වහන්සේලාගේ දෙමව්පියන්ට උපකාර කිරීමේ අරමුණින් පිහිටවූ "බුදුපුත් මාපිය භාරය" නැමැති අරමුදලෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,051,167 ක ශේෂයක් විය. එසේ වුවද, 2017 වර්ෂය දක්වා ඉදිරිපත් වූ නිවාස ඉල්ලීම් අයදුම්පත් 748 ක් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත යොමුකර තිබීම හා සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් වූ නිවාස ඉල්ලුම්පත් 9 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබීම හේතුවෙන් ඉල්ලීම් ඉටුකිරීමට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන භාරයේ තිබියදී අරමුණු ඉටුකර ගැනීමට කිසිදු නිවාස ආධාර වැඩසටහනක් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | නිවාස අමාත්‍යාංශය වෙත යොමුකරන ලද ඉල්ලුම් පත්‍ර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමුකර ඇත. බුදුපුත් මාපිය නිවාස ව්‍යාපෘතිය බුද්ධශාසන අරමුදලද සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ද නොවැලැක්විය හැකි හේතූන් නිසා ප්‍රමාද විය. | භාරය පිහිටුවීමේ අරමුණ වෙනුවෙන් පවත්නා අරමුදල් කාර්යෂක්ෂමව උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිවයිනේ එක් ශාසනාරක්ෂක මණ්ඩලයකින් එක් ශිෂ්‍යයෙකු/ ශිෂ්‍යාවක බැගින් තෝරාගෙන මාසයකට රු.500 බැගින් මාස 24 ක කාලයක් සඳහා රු.12,000 ක් ප්‍රදානය කිරීමේ අරමුණින් දහම් සිසු සවිය ශිෂ්‍යත්ව වැඩසටහන 2018 වර්ෂයේ දී ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ශාසනාරක්ෂක මණ්ඩල 288කින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 262 ක් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් සපුරා තිබියදී ශිෂ්‍යත්ව ලබාදීම සඳහා සිසුන් 139 ක් පමණක් තෝරාගෙන ඉන් සිසුන් 20කට මාස 10ක ශිෂ්‍යත්ව ආධාර ලෙස රු.100,000 ක් පමණක් ගෙවා තිබුණි. තවද, බදුල්ල, පුත්තලම, මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්කවලට අයත් ශාසනාරක්ෂක මණ්ඩල 35කින් මෙම ශිෂ්‍යත්වය සඳහා සිසුන් තෝරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී පවත්වන දහම් පාසල් දින උත්සවයට සමගාමීව ශිෂ්‍යත්වලාභීන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරනු ලබයි. බදුල්ල, පුත්තලම, මුලතිව්, වව්නියාව යන දිස්ත්‍රික්කවල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා විසින් 2017 දහම් දැනුම නිපුණතාවයෙන් ප්‍රථම ස්ථානය ලබාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නාම ලේඛන එවා නොතිබුණි. | තෝරා ගැනීම සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය කර ගනිමින් සුදුසුකම්ලත් සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ කටයුතු විධිමත්ව කළ යුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල් වර්ධනය කර ගැනීමේ අරමුණින් රු.300 ක මුදලකට දහම් පාසල් වෙත අලෙවි කිරීම සඳහා වර්ෂ 9කට පමණ පෙර රෙදිවලින් මුද්‍රණය කරන ලද දහම් පාසල් කොඩි 2,471 ක් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙහි ගබඩාවෙහි සහ ව්‍යාපෘති අංශයෙහි ගබඩාකර තිබුණි. මෙම කොඩි තොගය සම්බන්ධයෙන් තොග ලේඛන පවත්වාගෙන නොතිබුණු අතර කොඩි අලෙවි කිරීමේදී ලදුපත් නිකුත් කිරීමක්ද සිදු කර නොතිබුණි. තවද, කොඩි අලෙවි කිරීම හෝ වෙනත් සුදුසු වැඩපිළිවෙලක් යොදා ඉතිරි තොගය නිකුත් කිරීමට අරමුදලෙහි පාලක මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | පාලක මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් සාකච්ඡාකර සුදුසු වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 3.3 අරමුදල් ඌන උපයෝජන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 අංක (16) දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ 3 ඡේදයේ (අ) සිට (එ) දක්වා අරමුදලේ පොදු පරමාර්ථ 9 ක් දක්වා ඇති අතර එම පරමාර්ථ ඉටුකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය කළ මුදල රු.6,077,824 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි කිරීම්, ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම්වල රු.50,003,897 ක් පැවතිය ද පොදු පරමාර්ථ ඉටු කිරීම සඳහා එම අරමුදල් කාර්යක්ෂමව යෙදවීම කෙරෙහි අරමුදල අවධානය යොමු කර නොතිබුණි. | වර්ෂයතුලදී සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍ය ආධාර හා ගොඩනැඟිලි ආධාර ලෙස ගෙවීම් සිදු කරන ලදී. | අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එසේ සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් නොමැති බැවින් විගණනයක් සිදුකර නොමැත. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය සිදුකළ යුතු වීම. |